# කන්තලේ පොදු වෙළඳපොල කඩ කාමර ටෙන්ඩර් දැන්වීම.
# 2024-2026 වර්ෂය සඳහා
# කන්තලේ ප්‍රාදේශීය සභාව

කන්තලේ ප්‍රාදේශීය සභාවේ පොදු වෙළඳපොල කඩ කාමර පහත කොන්දේසි වලට යටත්ව ටෙන්ඩර් කැඳවනු ලබයි.

කන්තලේ ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් පොදු වෙළඳපොල කඩ කාමර සඳහා 2024.04.15 දින සිට 2026.12.31 ටෙන්ඩර් කැඳවනු ලැබේ.

❖ පොදු වෙළඳපොලේ ටෙන්ඩර් කැඳවීමට නියමිත කඩකාමර විස්තර.

| අනු අංකය | කඩ කාමර අංකය | පිහිටි ස්ථානය<br>බිම් මහල/ඉහල මහල | අවම ලංසුව (රු.)<br>(මාසික) |
|---|---|---|---|
| 1 | කඩ කාමර අංක 06 | බිම් මහල | 7500.00 |

ඉහත කඩ කාමර සඳහා ටෙන්ඩර්පත් 2024 මාර්තු 22 වන දින සිට 2024 අප්‍රේල් 04 වන දින දක්වා රජයේ වැඩ කරන දින වලදී පමණක් පස්වරු 3.00 දක්වා ප්‍රාදේශීය සභාව මඟින් නිකුත් කරනු ලබයි.

මෙම ටෙන්ඩර්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව වනුයේ 2024 අප්‍රේල් 05 වන දින පෙ.ව. 10.00 ට වේ.

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් කොන්දේසිවලට යටත් විය යුතුය.**

1. ටෙන්ඩර්පත් ආපසු නොගෙවන රු.1000.00 ක මුදලක් ප්‍රාදේශීය සභාවට ගෙවා ප්‍රාදේශීය සභාව විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලුම්පත්‍රය මඟින් පමණක් ඉල්ලුම් කල යුතුය.
2. ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත් ලේකම්, ප්‍රාදේශීය සභාව, කන්තලේ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය හැකිය.
3. ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් දිනය 2024.04.05 වන දින පෙරවරු 10.00 දක්වා වේ.
4. අතින් ගෙනැවිත් භාර දෙන්නේ නම් සභා කාර්යාලයේ ස්ථාපිත කර ඇති විශේෂ ලේඛනයේ සටහන් තබා කාර්යාලයේ ස්ථාපිත කර ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. තවද මෙය හොඳින් මුද්‍රා තබා තිබිය යුතුය.
5. එසේම ටෙන්ඩර්පත් බහා එවනු ලබන ලිපි කවරයේ ඉහල වම් කෙලවරේ ඉල්ලුම් කරන කඩ කාමරයේ අංකය(උදා- පොදු වෙළඳපොල කඩ කාමර අංක 06 කඩ කාමරය) ලෙස සටහන් කර තිබිය යුතුය.

CamScanner

6. ටෙන්ඩර් ලබාගන්නා අය විසින්ම රු. 50,000/- ක තැන්පතුවක් කඩ කාමරය ලබා ගැනීමට ප්‍රථම සභාව වෙත තැන්පත් කල යුතුය. මෙම මුදල මාසික කඩ කුලී මුදල් සඳහා හිලව් කරනු නොලැබේ.

7. කන්තලේ ප්‍රාදේශීය සභාවේ මීට පෙර කිසියම් දේපලක් බදුගෙන බදු ගෙවීම් පැහැර හැර ඇති දැනට අසාධුලේඛන ගත කර ඇති කිසිදු පුද්ගලයෙකුට හෝ ඔහුගේ පවුලේ කෙනෙකුට (විවාහක නම් කලත්‍රයා හා අවිවාහක දරුවන්, අවිවාහක නම් මව, පියා, අවිවාහක සහෝදර සහෝදරියන් ) වෙත ඉල්ලුම්පත් නිකුත්කරනු නොලබයි.

8. ටෙන්ඩර් විවෘත කිරීම 2024 අප්‍රේල් 05 දින පෙ.ව. 10.30 ට සිදු කරන අතර ඒ සඳහා ටෙන්ඩර්කරුට හෝ ඔහු විසින් ලිඛිතව බලය පැවරූ බලයලත් පුද්ගලයෙකුට ඒ සඳහා සහභාගී විය හැකිය. (බලයලත් පුද්ගලයා පැමිණෙන විට ලිඛිත අවසර පත්‍රය රැගෙන ආ යුතුය.)

9. මෙම ටෙන්ඩරය 2024.04.15 දින සිට ක්‍රියාත්මක වන අතර, ටෙන්ඩරය හිමි වන ටෙන්ඩර්කරු විසින් 2024.04.10 දිනට පෙර ගිවිසුම් අත්සන් කල යුතුය.

10. සාර්ථක ටෙන්ඩර් හිමිකරු ගිවිසුම් ගැනීමට රු. 50,000/- ක තැන්පතුව ගෙවා අවසන් කර තිබිය යුතුය.

11. ටෙන්ඩර්පත් ඇගයීමේදී කන්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි පුද්ගලයන්ට ප්‍රමුඛතාවය ලබා දෙන අතර, ඔවුන්ගේ පදිංචිය ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද ලිපියක් ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුය.

12. වැඩි විස්තර කාර්යාලයෙන් හෝ දුරකථන අංක 026-2234275 මඟින් ලබාගත හැකිය.

කේ.බී.ආර්.ජයවික්‍රම,

ලේකම්,

ප්‍රාදේශීය සභාව,

කන්තලේ.

2024.03.21

කේ.බී.ආර්.ජයවික්‍රම
ලේකම්
ප්‍රාදේශීය සභාව
කන්තලේ.